# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2202/19 – 2020 නොවැම්බර් 20 වැනි සිකුරාදා – 2020.11.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 නොවැම්බර් මස 22 වැනි දින අංක 1837/56 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 348 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තිය (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2011/එල්ආර්බී/44.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: GCF/ATH/KD/21A/LR.
2020 ඔක්තෝබර් මස 26 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 479ඊ බටපොත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තලංගම දකුණ (කඩුවෙල මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2019/456 හා 2020.02.19 දිනැති පැහැදිලි කිරීමේ අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස්වලට මායිම් :

**01. කැබලි අක්ෂර 'ඒ' – ලබුවැල්දෙනිය හෙවත් ඊරියගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0391(පර්. 15.46)**

උතුරට: කැබලි අක්ෂර B සහ කො. 9681 වැනි මූලික පිඹුරේ කැබලි අංක 27 සහ 23; නැගෙනහිරට: කො. 9681 වැනි මූලික පිඹුරේ කැබලි අංක 23, කො. 8559 වැනි මූලික පිඹුරේ කැබලි අංක 23 සහ 25; දකුණට: කො. 8559 වැනි මූලික පිඹුරේ කැබලි අංක 25 සහ 28 සහ කො.9681 වැනි මූලික පිඹුරේ කැබලි අංක 25; බටහිරට: කො. 9681 වැනි මූලික පිඹුරේ කැබලි අංක 25 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B.

11 - 401

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2028/46 හා 2017.07.20 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2017 අංක 169 හා 2017.07.17 වැනි දින දරන ආඥාවේ (අංක 2033/5 හා 2017.08.21 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ශුද්ධි පත්‍රිකාවෙන් සංශෝධිත) පහත සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මෙහි පහත විස්තර වන ඉඩම් කොටසේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 2028/46 හා 2017.07.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2017 අංක 169 හා 2017.07.17 වැනි දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2017/UDA/18.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කැ.ප්‍රා.ලේ/8/4/අත්44/1/කියංනැම්.
2020 ඔක්තෝබර් මස 26 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 562ඒ, සුවාරපොල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සුවාරපොල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක CO/KSB/2017/150 හා 2017.05.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත නමින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 01 – ගොරකබැද්දේවත්ත හෙවත් දෙල්ගහවත්ත වරි. අංක 1, මොරටුව පාර – ප්‍රමාණය: හෙක්. 4.9277 ක් පමණ**

උතුරට: කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 39, 27, 26, 24, 23, 22, මොරටුව පාර (කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 1), කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 20, 21 19, 16, 15, 46, 9 සහ 56; නැගෙනහිරට: කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 21, 19, 16, 15, 46, 9, 56, කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 03 සහ ප්‍රවේශ මාර්ගය; දකුණට: කඩඉම් සිතියම් අංක 521201 හි කලාප අංක 03 හි කඩඉම් සිතියම් අංක 52120104 හි කලාප අංක 04 හි කැබලි අංක 100; බටහිරට: අංක 521201 හි කලාප අංක 04 හි කැබලි අංක 97, 90, 89, 84, 74, 73, 64, 58, 45, 44, 39, 27, 26, 24, , 23 සහ 22.

11 - 402

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.